# පුරාභෙද සූත්‍ර
# Before the Break-up of the Body

My immense gratitude to the great Noble council of Akanitta brahma realm

12/12/2013




1) රාගයෙන් දැවීම ක්ෂේත්‍ර 1 වේ. මෙය ක්ෂේත්‍ර 2 ට තුඩුදේ. එය පියවර 1 සිට 7 දක්වා යැමෙන් පසුව සිදුවේ.

2) ලාභමච්ඡරිය සහ ආවාසමච්ඡරිය ක්ෂේත්‍ර 2 හි ඇතුළත් වේ. මෙය ක්ෂේත්‍ර 3 ට තුඩුදේ.

3) ධම්මමච්ඡරිය සහ වණ්ණමච්ඡරිය ක්ෂේත්‍ර 3 හි ඇතුළත් වේ. මෙය ක්ෂේත්‍ර 4 ට තුඩුදේ.

4) කොසජ්ජය සහ ශෝකය ක්ෂේත්‍ර 4 හි ඇතුළත් වේ. 5) රූපය නිසා ඇතිවන වේදනාව ලාභයක් ලෙස සිතා ආවාස කරගෙන ගෙන ඇත. මෙය දැකීමෙන් සම්මාදිට්ඨි ඇතිවේ.

6) බඩ පිරිසිදුව තබා ගැනීම ගැන සිතමු. බඩට යමක් දැම්මොත් එය ජරා වන්නේය. ඇතුල් නොකරන්නේ නම් පිරිසිදුව තබා ගැනීම කළ හැකිය. වත්ථූපම සූත්‍රයේ සඳහන් 16 කාරණා පරාමාස ගතවේ. එනම් අභිජ්ඣා, ව්‍යාපාදය, මක්ඛය, පළාසය, ඊර්ෂ්‍යාව, මච්ඡරිය, ...ප්‍රමාදය.

7) වත්ථූපම සූත්‍රය මෙන් අපි පිරිසිදු කර තබා ගත යුතුය.

තණ්හාය ජායතී සොකො, තණ්හාය ජායතී භයං;
තණ්හාය විප්පමුත්තස්ස, නත්ථි සොකො කුතො භයං.

තණ්හාව නිසා ශෝකය උපදනේ ය, තණ්හාව නිසා භය උපදනේ ය.
තණ්හාවෙන් මිදුනහුට ශෝකයෙක් නැත. බියක් කොයින් ද?




- සැකය නිසා භයෙන් අගතියට යෑම සිදුවේ.
- ශ්‍රද්ධාව ඇතිනම් භය නැතිවේ. එසේනම් තණ්හාව, අශ්‍රද්ධාව සහ සැකය නිසා භයෙන් අගතියට යෑම සිදුවේ.
- අශ්‍රද්ධාව -> උද්දච්ච
- උද්දච්ච -> ගුණමකුබව ( Makkho)
- ගුණමකුබව (Makkho) -> කුක්කුච්චය (kukkucca)
- දැන්, කුක්කුච්චය නිසා භයෙන් අගතියට යෑම සිදුවේ.




- භයෙන් අගතියට යෑමෙන් වැළකීමට නම්, බොජ්ඣංග ධර්මය භාවිතා කර මුදිතාවෙන් අප්‍රමාණයට යා යුතුය.
- මෙය සඳහා විරිය සමාධිය තිබිය යුතුය.

## නිරාසත්ති අනාගතෙ, අතීතං නානුසොචති;
## විවෙකදස්සී ඵස්සෙසු, දිට්ඨීසු ච න නීයති.

යමෙක් අනාගතයෙහි තෘෂ්ණා රහිත වේ ද, ඉක්මැගිය දෑයට ශොක නො කෙරේ ද, වර්‍තමාන චක්‍ෂුසම්ඵස්සාදියෙහි ආත්මාදිභාවවිවෙකය දකී ද, දෙසැට දිටු අතුරෙන් කිසි දෘෂ්ටියකින් නො පමුණුවනු ලැබේ ද, (ඔහු උපශාන්ත යයි කියමි.)




1) නිරාසත්ති අනාගතෙ

- අනාගතයෙහි මෙබඳු රූපයක් ඇතිවන්නෙක් වන්නෙමි යැයි එහි ආශාවෙන් යුක්ත නොවූයේ වෙයි, මෙබඳු වේදනාවක් ඇතිවන්නෙක් වන්නෙමි යැයි...
- තණ්හාව නොමැති නම් ක්ෂේත්‍ර A නිසා ක්ෂේත්‍ර B නොවේ.

2) අතීතං නානුසොචති

"පසුගිය දෙයට දුක් නොවේ" යනු වෙනසට පැමිණෙන වස්තුවෙහි හෝ ශෝක නොකරයි. ඒ වස්තුව වෙනස් වීමෙහි හෝ ශෝක නොකරයි. මාගේ ඇස වෙනස්වූයේ යැයි ශෝක නොකරයි.

- පසුගිය දෙයට දුක් නොවේ නම්, ක්ෂේත්‍ර C නිසා ක්ෂේත්‍ර D නොවේ.

3) විවෙකදස්සී ඵස්සෙසු - ස්පර්‍ශයන්හි විවේකය දක්නේ ය.

ඇසේ ස්පර්‍ශය තමා විසින් හෝ, තමා කෙරෙහි හෝ, නිත්‍ය වශයෙන් හෝ වලින් වෙන්ව බලයි. යළිදු හෝ අතීතවූ ස්පර්‍ශය, අනාගතය හා පවත්නා කල්හි ස්පර්‍ශයන්ගෙන් වෙන්කොට බලයි. අනාගතවූ ස්පර්‍ශය, අතීතවූද, පවත්නා කල්හිවූද, ස්පර්‍ශයන් ගෙන් වෙන්කොට බලයි. පවත්නා කල්හිවූ ස්පර්‍ශය, අතීතවූද, අනාගතවූ ස්පර්‍ශයන් ගෙන් වෙන්කොට බලයි.

- ක්ෂේත්‍ර B නිසා ක්ෂේත්‍ර C නොවිය යුතු බව දනී.

4) දිට්ඨීසු ච න නීයත - දෘෂ්ටීන්ටද නොපමුණුවයි

- ඔහුගේ දෙසැට දෘෂ්ටි ගැනීම ප්‍රහීණය, මුලින් සිඳුනේය. ශාන්ත විය, සංසිඳුනේය. ඉපදීමට අයෝග්‍යය. ඥානය නමැති ගින්නෙන් දැවුනේය. හෙතෙම දෘෂ්ඨියෙන් නොයයි.
- ක්ෂේත්‍ර B නිසා ක්ෂේත්‍ර D නොවිය යුතුය.